## නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

| අනු අංකය | සපයනු ලබන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුවම සම්බන්ධවන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංකය | කාර්යය නිම කිරීමට ගතවන අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 1. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම. | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 1 වන උපලේඛනයේ ඉල්ලුම් පත්‍රය හෝ නාගරික සංවර්ධන ප්‍රදේශ නොවන විට සභාවෙන් ලබා ගත් ඉල්ලුම් පත්‍රය<br>2. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 05 (ඉදිකිරීමේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවුද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ කාර්යාලයෙන් දැන ගැනීමට හැකි ය)<br>3. ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඉඩමේ අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක් (නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රදේශවලට පමණක් අදාළ වේ)<br>4. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික | පෙරටු කාර්යාල නිලධාරීන්<br>0112644447 | ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරී<br>0112645251<br>0112647012<br>දිගුව 249 | සති 02 ක් පමණ | නේවාසික රු.1000.00<br>වානිජ රු.1000.00<br>පෙරසැරි ගාස්තු වර්ගඵලය මත වෙනස් වේ. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 5. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත අයදුම්පත්‍රයේ සඳහන් කර අත්සන තැබාය යුතුය.<br>6. ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්<br>7. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක් (අවශ්‍ය අවස්ථාවේ)<br>8. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, ඉඩමේ හිමිකරුගේ නමින් දේපළ ලියා පදිංචි කර තිබිය යුතු ය<br>(අදාල කාර්තුවට හෝ වර්ෂයට වරිපනම් ගෙවා තිබිය යුතුය) | | | | |
| 2. | ඉඩම් අනු බෙදුම් හා ඒකාබද්ධ කිරීමේ සංවර්ධන සැලසුම් අනුමත කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 1 වන උපලේඛනයේ ඉල්ලුම් පත්‍රය<br><br>2. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ඉඩම අනු බෙදුමට හෝ ඉඩම් ඒකාබද්ධ කිරීමට අදාළ මිනින්දෝරු සැලැස්මේ පිටපත් 3 ක් (සංවර්ධනයේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවරෙක් ද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ කාර්යාලයෙන් දැන ගැනීමට හැකි ය) | පෙරටු කාර්යාල නිලධාරීන් 0112644447 | ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරී 0112645251 0112647012 දිගුව 249 | සති 01 ක් පමණ | අයදුම්පතට රු.800.00<br><br>පෙරසැරි ගාස්තු බිම් ප්‍රමාණය හා වර්ගඵලය මත වෙනස් වේ. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 3. සංවර්ධනයේ ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික<br>4. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක් (අවශ්‍ය අවස්ථාවලදී)<br><br>6. ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්<br><br>7. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, අදාල කාර්තුවට හෝ වර්ෂයට වරිපනම් ගෙවිය යුතුය. | | | | |
| 3. | සංවර්ධන බලපත්‍රයක වලංගු කාලය දීර්ඝ කිරීම. | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. අනුමත කළ සංවර්ධන සැලැස්මේ මුල් පිටපත<br>3. නිකුත් කළ සංවර්ධන බලපත්‍රයේ පිටපත.<br>4. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ දෙපැත්තේ සහතික කළ පිටපතක්. | පෙරටු කාර්යාල නිලධාරීන් 0112644447 | ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරී<br><br>0112645251<br>0112647012<br>දිගුව 249 | සති 01 ක් ඇතුළත | පෙරසැරි ගාස්තුව වසරකට රු.5000.00 |
| 4. | අනුකූලතා සහතිකය නිකුත් කිරීම. | 1. නාගරික සංවර්ධන ප්‍රදේශයක වන විට, නිවැරදිව සම්පූර්ණ කරන ලද 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 1 වන උපලේඛනයේ ඉල්ලුම් පත්‍රය හෝ සෙසු ප්‍රදේශ සඳහා සභාවෙන් ලබා ගත් ඉල්ලුම් පත්‍රය. | පෙරටු කාර්යාල නිලධාරීන් 0112644447 | ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරී<br><br>0112645251<br>0112647012<br>දිගුව 249 | සති 02 ක් | පෙරසැරි ගාස්තු වර්ග ප්‍රමාණය අනුව වෙනස් වේ. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 2. නිකුත් කළ සංවර්ධන බලපත්‍රයේ සහ අනුමත සැලසුමේ පිටපතක් බැගින්. | | | | |
| 5. | වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. ඉඩමට අදාළ මිනින්දෝරු සැලැස්මේ පිටපතක් | පෙරටු කාර්යාල නිලධාරීන් 0112644447 | ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරී 0112645251 0112647012 දිගුව 249 | පැයක් ඇතුළත | පෙරසැරි ගාස්තු රු.500.00 |
| 6. | මාර්ග පළුදු කිරීමට අවසර ඉල්ලීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. පළුදු කිරීමට අදහස් කරන මාර්ගයේ නියමිත ස්ථානයට ළඟා විය හැකි පහසු මාර්ගය පෙන්නුම් කරන දළ රූප සටහනක්.<br>3. අදාළ සේවා සම්බන්ධතාව සපයන ආයතනය විසින් නිකුත් කළ ලිපියේ පිටපතක්. | පෙරටු කාර්යාල නිලධාරීන් 0112644447 | ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරී 0112645251 0112647012 දිගුව 248 | විනාඩි 10 (නිසි පරිදි පවතින කාර්තුව සඳහා වරිපනම් බදු ගෙවා තිබිය යුතුය) | තාර වර්ග මීටර් 1 නිවාස රු.1500.00 වාණිජ රු.3300.00 කාපට් වර්ග මීටර් 1 රු.4947.00 අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් වර්ග මීටර් 1 රු.2100.00 කොන්ක්‍රීට් වර්ග මීටර් 1 රු.1133.00 බොරළු රු.277.00 |
| 7. | ගස්වලින් සිදු වන අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම | නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | පෙරටු කාර්යාල නිලධාරීන් 0112644447 | ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරී 0112645251 0112647012 දිගුව 249 | 1. පළමුවන නිවේදන යේ සඳහන් දින සිට දින 28ක් ඇතුළත | පෙරසැරි ගාස්තුව රු.200.00 |